# දැනුම් ආධිපත්‍යයට උදාහරණයක් වූ දෙමළ ජාතිවාදය

පෘතුගීසීන් හා ස්පාඤ්ඤයන් කතෝලිකයන් වුව ද ඔවුන් ලෝකය වටා ගියේ ඊනියා පුනරුදයෙන් පසුව ය. ඔවුහු ද නැගී එන චින්තනය යම් පමණකින් වුව ද නියෝජනය කළහ. එබැවින් ඔවුන්ට ද ආගම සංස්කෘතියෙන් තරමකට වෙන්කිරීමට හැකිවිය. ලංකාවේ ප්‍රධාන වශයෙන් වෙරළබඩ හා අනෙක් ප්‍රදේශවල ද කතෝලික ආගම ප්‍රචාරය වීමට වැඩි වේගයකින් කතෝලික  සංස්කෘතිය යම් පමණකින් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ද සමගින් ව්‍යාප්ත වූයේ එබැවිනි. අද මෙරට බයිලා ගයන්නේ හා කෆ්රිඤ්ඤා සංගීතයට හුරු වී ඇත්තේ කතෝලිකයන් පමණක් නො වේ. සිංහල බෞද්ධ සංස්කෘතියට යම් පමණකින් කතෝලික සංස්කෘතිය අවශෝෂණය වී ඇත.

ලන්දේසින්ගෙන් හා බ්‍රිතානීන්ගෙන් පසුව යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය තවදුරටත් සිංහල බෞද්ධ සංස්කෘතියට අවශෝෂණය කෙරිණි. ලන්දේසිහු හා බ්‍රිතානීහු පෘතුගීසීන්ට වඩා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අයත්වූහ. ඔවුහු ආගමින් ද කතෝලික නොවූහ. ලන්දේසීහු රෙපරමාදු ආගම ද ඉංගිරිසිහු ඇංග්ලිකන් ක්‍රිස්තියානි ආගම ද ඇදහුවෝ ය. ඔවුන්ට පෘතුගීසීන්ට වඩා ආගම සංස්කෘතියෙන් වෙන්කිරීමේ හැකියාව විය. අද මෙරට ඇංග්ලිකන් ආගම අදහන්නෝ සංඛ්‍යාත්මක ව එතරම් වැඩි පිරිසක් නො වෙති. එහෙත් ඔවුන්ට ජනමාධ්‍යය ජඩමාධ්‍යයක් කරගත් අයගේ ද, අධ්‍යාපනයේ ද බොරු උගත්කමක් මිස හරිහමන් විචාර බුද්ධියක්  නොමැති පඬියන්ගේ ද අවසාන වශයෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආධිපත්‍යයේ ද සහයෙන් මෙරට ඇංග්ලිකන් ක්‍රිස්තියානි සංස්කෘතිය ව්‍යාප්ත කිරීමටත් එහි ආධිපත්‍යය පිහිටුවීමටත් හැකි වී තිබේ.

මෙයින් අදහස් කෙරෙන්නේ ලන්දේසීන් හා ඉංගිරිසීන් තම තමන්ගේ ක්‍රිස්තියානි ආගම් ප්‍රචාරය කිරීමට මහන්සි නොගත් බව නො වේ. එහෙත් ඔවුන්ට ජුසේ වාස් පියතුමන් වැන්නකුගේ සහාය පසුවවත් නො ලැබිණි. පෘතුගීසීන්ට වුව ද ජුසේ වාස් පියතුමන්ගේ සහාය ඔවුන් මෙරට සිටි කාලයෙහි නො ලැබිණි. ජුසේ වාස් පියතුමා කතෝලික ආගම ප්‍රචාරය කෙළේ කතෝලිකයන්ට හිරිහැර කළ ලන්දේසීන් මෙරට සිටි කාලයෙහි ය. ලන්දේසීන්ගෙන් වූ කරදර හේතුවෙන් කතෝලිකයෝ හා ඔවුන්ගේ පූජකවරු සිංහල රජවරුන්ගෙන් සහාය පැතූහ. සිංහල රජවරු සිංහල කතේලිකයන් මාතලේ දිස්ත්‍රික්කයේ වහකෝට්ටේ ආදී ප්‍රදේශවල පදිංචි කළහ. එමෙන් ම ඒ රජවරු ජුසේ වාස් වැනි පියතුමන්ට කතෝලික ආගම ප්‍රචාරය කිරීමට ආධාර කළහ. සිංහල බෞද්ධයන්ගේ මේ ගුණය තවමත් දක්නට ලැබෙන අතර ඇතැම්හු ඒ සිංහල බෞද්ධයන්ගේ දුර්වලකමක් යැයි සිතමින් ඉන් අයුතු ප්‍රයෝජන ගැනීමට උත්සාහ කරති.

ලන්දේසීන් හා ඉංගිරිසින් හැකි පමණින් තම ආගම ද ප්‍රචාරය කළ බව රහසක් නො වෙයි.  ඔවුන් විසින් පිහිටුවන ලද පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමේ දී ඒ ඒ ආගම්වලට හරවාගැනීමට ඔවුහු කටයුතු කළහ. එමෙන් ම තනතුරු හා වරප්‍රසාද දීමෙන් ද තම ආගම්වලට හරවාගැනීමට ඔවුහු ක්‍රියා කළහ. ඒ සමග ඔවුහු ඒ පාසල් හා අර්ථ ක්‍රමය ඔස්සේ තම සංස්කෘතිය ප්‍රචාරය කිරීම ද දිගින් දිගට ම කළහ.

එහෙත් කතෝලික ආගම තරමට අනෙක් ක්‍රිස්තියානි ආගම් මෙරට ව්‍යාප්ත නො වී ය. එමෙන් ම සිංහලයන් අතර ක්‍රිස්තියානි හා කතෝලික ආගම් ප්‍රචාරය වූවාට වඩා සාර්ථකත්වයකින් දෙමළ ජනයා අතර ඒ ආගම් ප්‍රචාරය විය. රාජ්‍ය අනුග්‍රහය ලැබීමෙන් පසුව ද ක්‍රිස්තියානි ආගම්වලට සිංගලයන් අතර මුල් බැස ගැනීමට නො හැකි විය. බුදුදහම ලංකාවේ ව්‍යාප්ත වූයේ එයට රාජ්‍ය අනුග්‍රහය ලැබීම නිසා යැයි පවසන පඬියන් රාජ්‍ය අනුග්‍රහය ලැබීත් සිංහලයන් අතර ක්‍රිස්තියානි ආගම් ප්‍රචාරය නොවූයේ ඇයි දැයි තේරුම් කර දිය යුතු ය.

එහෙත් ක්‍රිස්තියානීන් විශේෂයෙන් ම ඉංගිරිසින් තම සංස්කෘතිය ව්‍යාප්ත කිරීමෙහි ලා දක්ෂතාවක් දක්වා ඇති බව පැහැදිලි ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ විශේෂ ලක්ෂණයක් වනුයේ ද එහි සංස්කෘතිය එනම් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ලොව පුරා පැතිරවීම ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට තම සංස්කෘතික ආධිපත්‍යය ඔස්සේ ලොව පාලනය කිරීමේ හැකියාව ද ලැබී ඇත. ලංකාවේ මෙන් ම ලෝකයේ ද  එහි දී ප්‍රධාන වශයෙන් ම බලපා ඇත්තේ අධ්‍යාපනය හා ජනමාධ්‍ය ය.

© Prof. Nalin De Silva

එක්තරා අයුරකින් ගත්කල අද බටහිරයන් ලෝකයේ දේශපාලන ආධිපත්‍යය දරන්නේ හුදු දේශපාලනික ක්‍රියාවලියක් නිසා නොවන බව පෙනී යයි. ඒ මුළුමනින් ම මෙන් සංස්කෘතික ආධිපත්‍යයක ප්‍රතිඵලයකි. එහි දී ආර්ථික ආධිපත්‍යය ද යම් ප්‍රමාණයකට යොදා ගැනෙයි. ඉරාකයේ දී හෝ ඇෆ්ගනිස්ථානයේ දී හෝ බටහිරයන් සෘජු ව ම දේශපාලනික ව මැදිහත්වන නමුත් ඇතැම් රටවල දී ඇතැම් අවස්ථාවල දී ඔවුහු ආර්ථික ආධිපත්‍යය යොදා ගනිති. මුළු ලොව ම ආර්ථික වශයෙන් ද එකට ගැටගසා තම ආර්ථික ක්‍රමයට සියල්ල බැඳ දමා ඇති බැවින් බටහිරයන්ට ආර්ථික සම්බාධක පැනවීම් ආදියෙන් දේශපාලන ආධිපත්‍යය ක්‍රියාත්මක කළ හැකි ය.

එහෙත් අද වඩාත්ම ක්‍රියාත්මක වන්නේ සංස්කෘතික ආධිපත්‍ය ය. අද මුළු ලොවෙහි ම නිල අධ්‍යාපනය සිදු කෙරෙන්නේ බටහිරයන්ට අවශ්‍ය ආකාරයට ය. අද ලෝකයේ නිල අධ්‍යාපනය යනු බටහිර අධ්‍යාපනය ය. පෙර පාසලේ (එය ද බටහිර සංකල්පයකි) සිට පශ්චාත් උපාධි දක්වා සියල්ල බටහිර අච්චුවේ ම සිදු වෙයි. බටහිර දැනුම ලෝකයේ ම දැනුම බවට පත් වී ඇත. අද ඇත්තේ බටහිර දැනුම් ආධිපත්‍යයකි. අපේ ප්‍රවාද ගොඩනැගෙන්නේ ම බටහිර දැනුම් ආධිපත්‍යයට එරෙහිව ය.

බටහිර දැනුම හැරෙන්නට අනෙක් දැනුම් ඊනියා දේශීය දැනුම්, සාම්ප්‍රදායික දැනුම්, පැරණි දැනුම් ආදි වශයෙන් හැඳින්වෙන්නේ බටහිර දැනුම ද තවත් දේශීය දැනුමක් පමණක් බව අමතක කරමිනි. පාසල් හා විශ්වවිද්‍යාල හැරෙන්නට ජනමාධ්‍යය ද බටහිර සංස්කෘතික ආධිපත්‍යය පැතිරවීමේ දී යොදා ගැනෙයි. අද ජනමාධ්‍යය ඔස්සේ විශේෂයෙන් ම විද්‍යුත් මාධ්‍යය ඔස්සේ මුළු ලොව පුරා ම බටහිර සංස්කෘතිය බෙදා හැරෙයි. ලංකාවේ ද තත්වය එය ම බව අපි දනිමු. මෙරට ගම් වෙනස්වීමට පටන්ගත්තේ රූපවාහිනී මාධ්‍යය ව්‍යාප්ත වීමත් සමග ය.

කියවීමට, ඇසීමට ඇති දෙයට වඩා පෙනෙන්නට ඇති දෙය අනුකරණය කිරීමට මිනිස්සු පෙළඹෙති. මෙරට සිටින අනුකාරක මාධ්‍යවේදියෝ පිටරටක ඇති වැඩසටහනක් අළුත් දෙයක් හඳුන්වාදීමක් යැයි කියමින් මෙරට නාලිකා ඔස්සේ ප්‍රචාරය කරති. මේ වැඩසටහන් බොහෝමයක් පහේ පංතියේ වැඩ සටහන් පමණක් නොව පිටරට වැඩසටහන්වල ගොරහැඩි පිටපත් ද වෙයි. එහෙත් ඒ වැඩසටහන් ඔස්සේ ගම් දනවි කරා පැතිර යන්නේ අපේ සංස්කෘතියට සාර ධර්මවලට පටහැණි කරුණු ය. ඒ ඔස්සේ රට පුරා පැතිර යන පණිවුඩය නම් අප තව තවත් බටහිර පසුපස යා යුතු බව ය.

අප කෙතරම් බටහිර දැනුමෙන් පාලනය වන්නේ ද යන්න දෙමළ ජාතිවාදය පිළිබඳ ප්‍රශ්නයේ දී පැහැදිලි වෙයි. දෙමළ ජාතිවාදය යන්න පවා යොදා ගැනීමට බොහෝ අය මැළි වෙති. එහෙත් ඔවුහු කිසිම වගවිභාගයක් නැතිව සිංහල ජාතිවාදය යන්න යොදා ගනිති. සමස්ත ප්‍රශ්නය ම ඉදිරිපත් කෙරුණේ සිංහලයන්ගෙන් දෙමළ ජනයාට කෙරෙන අසාධාරණකම්වලට විරුද්ධව දෙමළ ජනයා ප්‍රතිචාර දැක්වීමක් ලෙස ය. මුල දී සාමකාමීව අවිහිංසාව පෙරදැරි කරගෙන ප්‍රතිචාර දැක්වූ දෙමළ ජනයා පසුව විසඳුම් නොමැති විට තමන්ගේ නිජ භූමියෙහි වෙනම රාජ්‍යයක් කරා තල්ලු වූ බවත් එයටත් පසුව ඒ වෙනම රාජ්‍යය දිනාගැනීම සඳහා ආයුධ අතට ගත් බවත් සඳහන් කෙරිණි. එපමණක් නොව දෙමළ ජනයා අවුරුදු දහස් ගණනක් තිස්සේ ඒ නිජභූමියෙහි රාජ්‍යයක් පවත්වාගෙන ගිය බව ද කියැවිණි. දෙමළ ජනයාගේ රාජ්‍යය අද සිංහලයන් අතට පත්කර ඇති බැවින් එය නිදහස් කරගැනීම දෙමළ ජනයාගේ වගකීම ලෙස සැලකිණි. සමස්ත ප්‍රශ්නයට වරදකරුවන් සිංහලයන් බවට මතයක් ඇතිකරනු ලැබිණි.

මේ ප්‍රවාදය සම්පූර්ණයෙන් ම බටහිරයන්ගේ ප්‍රවාදයක් විය. එය ගොතනු ලැබුයේ මූලිකව ම බටහිර විශ්වවිද්‍යාලවල බුද්ධිමතුන් විසිනි. ඒ ලෝ පුරා, එනම් බටහිර රටවල් පුරා, ප්‍රචාරය කෙරුණේ බටහිරයන් විසිනි. මේ මූලික ප්‍රවාදයට අමතරව තවත් අතුරු ප්‍රවාද ද ගොතනු ලැබිණි. බෞද්ධයනට යුද්ධ කිරීම අකැප යන්න ඉන් එකක් විය. ඒ සඳහා විවිධ ලිපි ලේඛන පොත පත ලියැවිණි. ස්ටැන්ලි තම්බයියා හම් දෙමළ ක්‍රිස්තියානි බුද්ධිමතා බුදුදහම පාවාදීම යනුවෙන් පොතක් පළ කරමින් කියා සිටියේ යුද්ධ කිරීමෙන් සිංහල බෞද්ධයන් බුදුදහම පාවා දී ඇති බව ය.

බෞද්ධයනට යුද්ධය අකැප යැයි කියන අතර බටහිරයෝ තවත් මතයක් ප්‍රචාරය කළහ. එනම් ප්‍රභාකරන් යුද්ධයෙහි අති දක්ෂයකු බවත් ඔහු ලෝකයේ පහළ වූ දක්ෂතම යුද නායකයකු බවත් ඔහුගේ කොටි සංවිධානය කිසි දිනෙක පැරදවිය නොහැකි ගරිල්ලා සංවිධානයක් බවත් ය. ඒ සමගම ගැටුම් නිරාකරණය නමින් දැනුම් පද්ධතියක් හමුදාවට

© Prof. Nalin De Silva

හා අනෙක් අයට ලබාදෙමින් යුද්ධය වෙනුවට සාකච්ඡා මාර්ගයෙන් ගැටුම් විසඳන ආකාරයක් ගැන කියා සිටියෝ ය. නැති ප්‍රශ්නයකට සිංහලයන් වරදකරුවන් කරමින් ඉන්පසු බොරු සිල්වතුන් බවට පත්කර අවසානයේ නිවටයන් කර පරාද කිරීම බටහිරයන්ගේ අරමුණ විය. මේ අරමුණ සාක්ෂාත් කරගැනීමෙහි ලා බටහිරයන්ට තමන් විසින් පුහුණු කරනු ලැබ සිංහලයන්ට ලබාදුන් ඊනියා සිංහල නායකයෝ සිටියහ. එමෙන් ම එයට සරිලන හමුදා නායකයෝ ද ඔවුන්ට වූහ. මේ සියල්ල පිටුපස වූයේ දේශපාලන අරමුණක් වුව ද බටහිරයන් එහි දී යොදාගත්තේ තමන් සතු වූ සංස්කෘතික ආධිපත්‍යයත් එහි කොටසක් වූ දැනුම් ආධිපත්‍යයත් ය.

බටහිරයන්ගේ දැනුම් ආධිපත්‍යයෙන් බිහි වූ මේ ප්‍රවාද හා මතිමතාන්තර පරාජය නොකර ඊනියා යුද්ධය ජයගැනීම අපහසු බව අපි තේරුම් ගතිමු. ඊනියා යුද්ධය යන්න ද බටහිරයන්ගේ ව්‍යාජ සංකල්පයක් විය. ඔවුන් ඉන් අදහස් කෙළේ එක්කෝ රටවල් දෙකක් අතර යුද්ධයකි. එසේත් නැතහොත් සිවිල් යුද්ධයකි. එහෙත් ලංකාවේ රටවල් දෙකක් අතර යුද්ධයක් හෝ සිවිල් යුද්ධයක් හෝ නොමැති විය. අපට තිබුණේ රජයට විරුද්ධව අවිගත් ත්‍රස්තවාදී කණ්ඩායමක් පරාජය කිරීමේ ප්‍රශ්නය පමණකි. ඒ කිසිසේත්ම යුද්ධයක් නො වි ය.

යුද්ධය යන වචනය යොදාගැනීමෙන් බටහිරයෝ හා මෙරට ඔවුන්ගේ ගැත්තෝ ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදී කොටි රජයේ හමුදා මට්ටමට නෛතිකව ගෙන ඒමට කැසකැවූහ. සංකල්ප භාවිතයේ දී අපි ඉතාමත් ප්‍රවේසම් විය යුතු වෙමු. වැරදි සංකල්ප භාවිතා කිරීමෙන් අපට වැරදි ප්‍රතිඵල ලැබෙනු ඇත. බටහිරයන් හා ඔවුන්ගේ ඇම්බැට්ටයන් කෙතරම් ප්‍රචාරය කළ ද ඒ මතවාද හා ප්‍රවාද පරාජය කිරීමට ජාතික ව්‍යාපාරයට හැකි විය. රණවිරුවන් ලබා ඇති ජයග්‍රහණ හමුවේ ජාතික ව්‍යාපාරය විසින් ලබා ඇති අත්දැකීම් හා ජයග්‍රහණ ඉතා සුළු ය. එහෙත් ඒ ජයග්‍රහණ ඔස්සේ මුළු රටම අවදි වී ඇති බව පමණක් සඳහන් කළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva